**මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනැන්ස් පීඑල්සී සමාගම - 2016**

---

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ පාඩු ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනැන්ස් පීඑල්සී සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන සහ සමාගම හා එහි පරිපාලිතයෙහි ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.2 අවධාරණය කළ කරුණු

---------------------------

මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව, පරිපාලිත සමාගම වන සීමාසහිත එම්බීඑස්එල් රක්ෂණ සමාගමට අදාළ මූල්‍ය ප්‍රකාශනයන්හි පහත සඳහන් සටහන්වලට ඔබගේ අවධානය යොමු කරමි.

- සීමාසහිත එම්බීඑස්එල් රක්ෂණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයට අදාළ මූල්‍ය ප්‍රකාශනවල 44 සටහන

- වර්ෂය තුළ දක්වන ලද කාර්යසාධන බැඳුම්කර රක්ෂණ හිමිකමට අදාළ අසම්භාව්‍ය බැරකම විස්තර කෙරෙන 47.2.2 සටහන - මෙම කරුණු සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු නොලැබේ.

### 2.1.3 වෙනත් කරුණු

------------------

පරිපාලිතය වන එම්බීඑස්එල් රක්ෂණ සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අවධාරණය කරන ලද කරුණු සමඟ 2016 මැයි 18 දින එම ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කරන ලද වෙනත් විගණකවරයෙකු විසින් මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය කරන ලදී.

### 2.1.4 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තා කිරීම

------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගමේ පනතේ 163(2) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පහත කරුණු සඳහන් කරමි.

(අ) මතය පිළිබඳ පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණන සඳහා අවශ්‍ය වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත්ය,

- සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිය සහ 153 වගන්තියට අනුකූල වන බවත්ය.

- කෙසේ වුවද, පරිපාලිතයේ ශුද්ධ වත්කම් ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අර්ධයකටත් වඩා අඩු බවත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය ප්‍රකාර ප්‍රාග්ධන තත්ත්වය පිළිබඳ බරපතල පාඩුවකට මුහුණ දෙන බවත් අවධානයට ලක් කළ යුතුය.

- මූල්‍ය ප්‍රකාශනවල 44 සටහනේ සාකච්ඡා කර ඇති පරිදි, 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ (සංශෝධන) 53 වගන්තියට අනුකූලව පරිපාලිතය දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ලෙස වෙනම සමාගම් දෙකකට වෙන්කර නොමැත.

- පරිපාලිතයේ ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සඳහා හා 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ රෙගුලාසිය මගින් ලබාගත හැකි මුළු ප්‍රාග්ධනය "නුබුන්වත් ආන්තිකය (අවදානම පදනම් වූ ප්‍රාග්ධනය)" 2015 රීතිය සඳහා අවම අවශ්‍ය ප්‍රවේශ ලක්ෂ්‍යය සම්පූර්ණ නොකරන අතර ජීවිත රක්ෂණ ව්‍යාපාරය විසින් ලබාගත හැකි මුළු ප්‍රාග්ධනය සඳහා අවශ්‍ය අවම ප්‍රවේශ ලක්ෂ්‍යය සම්පූර්ණ නොකරයි.

## 2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම්

### 2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.මු.වා.ප්‍ර/ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූලව සමූහයේ මූල්‍ය ප්‍රකාශන සමාගමේ, එහි පරිපාලිතයෙහි හා ආශ්‍රිතයෙන් සමන්විත විය. පරිපාලිතයෙහි අයිතියෙන් සියයට 84.12 ක් සමාගමටද, ආශ්‍රිත සමාගමෙන් සියයට 29 ක අයිතියක් එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් සමාගමට, ලංකා සිකුයුරිටීස් (පෞද්ගලික) සමාගමට සමාලෝචිත වර්ෂය අවසානයට තිබුණි.

2016 දෙසැම්බර් 31 දිනට හා ඉකුත් වර්ෂය අවසානයට ඉහත සමාගම්වල ආයෝජනයන් පහත දැක්වේ.

| සමාගමේ නම | ආයෝජනය | |
|---|---|---|
| | 2016<br>රු.'000 | 2015<br>රු.'000 |
| පරිපාලිත - මිල නොලත් සමාගම් | | |
| එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් සමාගම | 516,096 | 516,096 |
| අඩුකළා - හානිකරණය සඳහා වෙන්කිරීම් | (438,790) | (205,899) |
| පරිපාලිතයන්හි ශුද්ධ ආයෝජනයන් | 77,306 | 310,197 |
| ආශ්‍රිත - මිල නොලත් සමාගම් | | |
| ලංකා සිකුයුරිටීස් (පුද්ගලික) සමාගම | 81,084 | 81,084 |
| අඩුකළා හානිකරණ සඳහා වෙන්කිරීම් | - | - |
| ආශ්‍රිතවල ශුද්ධ ආයෝජන | 81,084 | 81,084 |
| මුළු ආයෝජනයන් | 158,390 | 158,390 |

**2.3 සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.මු.වා.ප්‍ර. හා ශ්‍රී.ල.ගි.ප්‍ර.) අනුකූලවීම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 40 - ආයෝජන දේපළ

(i) ආයෝජන දේපලවල අගය වර්ෂ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. කෙසේ වුවත්, පිටකෝට්ටේ හා පුත්තලමේ පිහිටි පිළිවෙලින් රු.4,255,554 ක හා රු.600,000 ක දේපළවල වටිනාකම පසුගිය වර්ෂ 05ක කාලය තුල ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි. එම නිසා, සමාගමේ ප්‍රතිපත්තියට මෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40 ට එය අදාල නොවන බව පෙන්වා දෙනු ලැබේ.

(ii) අවසාන මූල්‍ය ප්‍රකාශනවල වූ කොළඹ 11 හා කෝට්ටේ පිහිටි දේපළ පිළිවෙලින් රු.75,000,000 ක හා රු.14,727,000 ක සාධාරණ වටිනාකමට වඩා අඩුවෙන් විකිණීමෙන් ලැබුණු විකුණුම් ආදායම පිළිවෙලින් රු.36,500,000 ක් හා රු.6,500,000 ක් විය.

(ආ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 16 - දේපළ පිරියත හා උපකරණ

ශ්‍රී.ල.ගි.ප්‍ර. 16 ට අනුව වත්කමක් පාවිච්චියට ගන්නා අවස්ථාවේදී ආයතනය විසින් දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම ආරම්භ කළ යුතුවේ. කෙසේ නමුත් සමාගම විසින් වත්කම පාවිච්චියට ගත් දිනය නොසලකා අත්පත් කරගත් මාසයේදී සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. එම නිසා වර්තමාන ක්ෂය කිරීමේ ක්‍රමය ශ්‍රී.ල.ගි.ප්‍ර. 16 ට එකඟ නොවුණි.

**2.3.2 මූල්‍ය ආයෝජන - ව්‍යාපාරය සඳහා පැවති**

මූල්‍ය ප්‍රකාශන අනුව වාර්තා කර තිබුණු කොටස් ගණන හා මධ්‍යම තැන්පතු හුවමාරු ප්‍රකාශනය අතර වෙනස්කම් අනාවරණය විය. එම වෙනස නිසා එකතු මූල්‍යාමය බලපෑම රු.2,859,524 ක් විය.

**2.3.3 ආරම්භක කලින් ගෙවීම් වර්ෂයේ වියදමක් ලෙස හඳුනා නොගැනීම**

වෙනත් වත්කම් යටතේ පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද රු.1,063,307 ක කලින් ගෙවීම් වර්ෂයේ වියදමක් ලෙස හඳුනා නොගැනීම නිසා වෙනත් වත්කම් මෙන්ම වර්ෂය සඳහා වූ ලාභය එම කලින් ගෙවීම් හේතුවෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**2.3.4 දීර්ඝ හිඟහිටි ශේෂය හා ඍණ ශේෂ**

(අ) බැංකු සැසඳුම් ප්‍රකාශනවල "බැංකු වැරදි" යනුවෙන් විෂය අයිතමයක් තිබුණි. සමාගම පද්ධතිය තුලට අදාල ලැබීම් සම්මත නොකිරීම එම වරද සඳහා හේතුව වී තිබුණි. චෙක්පත් ආපසු ලැබී තිබුණද ගිණුම්ගත කර නොතිබුණි. 2016 දෙසැම්බර් මාසයට වූ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ 2015 වර්ෂයේ දීර්ඝ හිඟ හිටි ශේෂ උප විෂයයක් වූ "බැංකු වැරදි" යටතේ දක්නට ලැබුණි.

(ආ) වෙනත් වත්කම් සඳහා වෙන්කිරීම් යනුවෙන් හැදින්වූ දීර්ඝ හිඟහිටි ශේෂ, අඩමාන ණය සඳහා වෙන්කිරීම්, ණයගැතියෝ හා පොදු අත්තිකාරම් යටතේ පිළිවෙලින් රු.2,901,626 ක්, රු.1,239,871 ක් රු.20,244,936 ක් හා රු.1,384,151 ක් වෙනත් වත්කම් යටතේ තිබුණි.

කෙසේ නමුත් ඉහත ශේෂ අය කර ගැනීම සැක සහිත වූ අතර මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වත්කම් ශේෂ වැඩිපුර දැක්වීම සිදුවිය හැකිව තිබුණි.

(ඈ) පසුගිය වර්ෂවල සිට වෙනත් වගකීම් යටතේ ඉදිරියට ගෙන එන ලද රු.21,103,679 ක දීර්ඝ හිඟහිටි ශේෂ නිරීක්ෂණය වී තිබුණි.

(ඈ) සමහර කල්බදු හා කුලීපිට ගැනුම් පහසුකම්වල ශුද්ධ හෙළිදරව් කිරීම 2016 දෙසැම්බර් 31 දිනට සෘණ රු.6,052,789 ක් විය.

**2.3.5 දේපළ පිරියත හා උපකරණ**

------------------------------

(අ) මෝටර් රථ, පරිගණක උපාංග, කාර්යාල උපකරණ, කාර්යාල ලී බඩු සවිකිරීම් හා මෙවලම්, වෙනත් වත්කම් හා දුරකථන පද්ධතිය සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණත් මෙම වත්කම්වල ඵලදායී ජීවිත කාලය යළි තක්සේරු කිරීමකින් හා මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගැලපීමකින් තොරව ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එමනිසා දේපල, පිරියත හා උපකරණවල සත්‍ය තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය නොවිණි. ඉහත වත්කම්වල පොත් අගය රු.236,982,078 ක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව අංක 474 හැදල පාරේ පිහිටි ඉඩමේ වටිනාකම රු.9,961,400 ක් වූ අතර ඉඩම් ලියාපදිංචි කිරීමේ ඔප්පුව අනුව එහි අගය රු.5,906,200 ක් විය. මේ නිසා වටිනාකමෙහි රු.4,055,200 ක වෙනසක් නිරීක්ෂණය විය. එබැවින් දේපළ පිරියත හා උපකරණවල අගය වැරදි ලෙස දක්වා තිබුණි.

**2.3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| රෙගුලාසිය | අවශ්‍යතාවය | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකාවේ බලපත්‍රධාරී මූල්‍ය සමාගම් වෙනුවෙන් 2008 අංක 03 දරන මූල්‍ය සමාගම් (සංස්ථාපිත පාලනය) වෙනුවෙන් වූ නියෝග අංකයේ 7(2) වගන්තිය | සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයකු විය යුතුය. සභාපති ස්වාධීන විධායක අධ්‍යක්ෂකවරයෙකු නොවන අවස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන නොවන විධායක අධ්‍යක්ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂක සුදුසු පරිදි සහතිකවීමට යොමුගත ප්‍රධාන ස්වාධීන මූලිකාංග ලේඛනගත කළ යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂකගේ පදවිනාමය මූල්‍ය සමාගමේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කළ යුතු වේ. | සභාපති ස්වාධීන නොවන විධායක අධ්‍යක්ෂක නොවුවද සමාගම විසින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂකගේ පදවිනාමය වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකාවේ බලපත්‍රධාරී මූල්‍ය සමාගම් වෙනුවෙන් 2008 අංක 03 දරන මූල්‍ය සමාගම් | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් යාවත්කාලීන ව්‍යාපාර අවිච්ජින්න | මුදල් වර්ෂය තුල අවම රැස්වීම් සංඛ්‍යාව ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි. |

| | |
|---|---|
| (සංස්ථාපිත පාලනය) වෙනුවෙන් වූ නියෝග අංකයේ 7(2) වගන්තිය | සැලසුම් ඇතුලත්ව සියළුම අංශයන්ගේ අවධානම් කළමනාකරණය තක්සේරු කර බැලීමට රැස්විය යුතු වේ. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර රු.මිලියන 81.14 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදුවලට පෙර රු.මිලියන 3.28 ක ශුද්ධ ලාභයක් වූ අතර එය රු.මිලියන 77.86 ක හෙවත් සියයට 2,373.78 ක වර්ධනයක් නිරූපනය විය. පසුගිය වර්ෂයේ බදුවලට පසු අලාභය වූ රු.මිලියන 78.31 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය පරිපාලිතය හැර රු.මිලියන 85.62 ක ලාභයක් වූ අතර එය මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 163.93 ක හෙවත් සියයට 209.34 ක වර්ධනයක් නිරූපණය විය.

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය සඳහා සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රතිඵල විවිධ අවස්ථාවලදී සාරාංශයක් පහත සටහනේ දැක්වේ.

| | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | 2016 රු.'000 | 2015 රු.'000 | වෙනස සියයට | 2016 රු.'000 | 2015 රු.'000 | වෙනස සියයට |
| ශුද්ධ පොලී ආදායම | 2,028,170 | 1,939,834 | 4.55 | 2,142,450 | 2,029,708 | 5.55 |
| එකතු මෙහෙයුම් ආදායම | 2,178,551 | 2,083,666 | 4.55 | 2,478,337 | 2,579,118 | (3.91) |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 2,154,312 | 1,621,515 | 32.86 | 2,450,378 | 2,104,500 | 16.44 |
| ආදායම් බදුවලට පෙර ලාභය | 239,871 | (35,428) | 777.06 | 246,800 | 56,001 | 340.71 |
| වර්ෂය සඳහා ලාභය | 85,624 | (78,306) | 209.34 | 81,142 | 3,283 | 2,371.58 |

### 3.2 අගය එකතු කිරීමේ ප්‍රකාශනය

| | 2016 රු.මිලියන | 2015 රු.මිලියන මිල ප්‍රකාශිත |
|---|---|---|
| අගය එකතු කිරීම | | |
| - මුළු ආදායම | 4,888 | 4,217 |
| - ණය ගැනීම් පිරිවැය හා සහායක සේවාවන් | (3,738) | (2,914) |
| - අඩමාන ණය හා ආයෝජන සඳහා වෙන්කිරීම් | (24) | (462) |
| | 1,126 | 841 |
| අගය වෙන්කළ කොටස | | |
| - සේවකයින්ට ගෙවීම් | 782 | 671 |
| - රජයේ බදු | 266 | 100 |

| | | |
|---|---|---|
| - ක්ෂය | 78 | 70 |
| | ------- | ----- |
| | 1,126 | 841 |

**3.3 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය**

**3.3.1 ප්‍රමාණාත්මක ගිණුම්කරණ අනුපාත**

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය සඳහා සමහර ප්‍රමාණාත්මක ගිණුම්කරණ අනුපාත පහත දැක්වේ.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සමාගමේ ලාභදායිත්වය සතුටුදායක විය. පසුගිය වර්ෂයේ ශුද්ධ අලාභ අනුපාතය වූ 1.86 සිට 1.75 ක ශුද්ධ ලාභ අනුපාතයක් දක්වා වර්ධනය වී තිබුණි. තවද, සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය හා ස්කන්ධය මත ප්‍රතිලාභය සියයට ඍණ 0.28 සිට ධනාත්මක 0.28 ට වැඩි වී තිබුණි.

(ii) මහ බැංකුව පිළිගත් සියයට 10 ක් වූ අනුපාතයට වඩා සමාගමේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (පෙළ 1+2) සියයට 10.69 ක් විය. 2015 වර්ෂයේදී මෙම සියයට 11.91 කින් පහත වැටී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය හා 2015 වර්ෂය සඳහා සමාගමේ තැන්පත් මත ණය අනුපාතය පිළිවෙලින් සියයට 146 ක් හා සියයට 147 ක් විය. 2016 හා 2015 වර්ෂවලදී බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (weighted average cost of capital) අනුපාතය පිළිවෙලින් සියයට 11.56 ක් හා සියයට 9.29 ක් විය.

(iv) සියයට 1.75 ක හා සියයට 11.35 ක ඉහළ ද්‍රවශීලතා අනුපාතයක් පිළිවෙලින් 2016 හා 2015 වර්ෂයේදී සමාගමේ තිබීමෙන් කාරක ප්‍රාග්ධනය විධිමත්ව පාලනය කර නොතිබුණු බව පෙන්වයි.

3.4 සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට පරිනත විවර විශ්ලේෂණය (Maturity gap analysis)

සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂයක් ඇතුලත හා මාස 03 කට අඩු කාලසීමාවක් සඳහා පිළිවෙලින් රු.මිලියන 8,690 ක හා රු.මිලියන 7,681 ක ඍණ පරිනත විවර වටිනාකම් තිබුණි.

| | ඉල්ලුම් කිරීමේදී රු.'000 | මාස 03 දක්වා රු.'000 | මාස 03 සිට 12 දක්වා රු.'000 | වර්ෂ 1 සිට 3 දක්වා රු.'000 | වර්ෂ 03 සිට 5 දක්වා රු.'000 | වර්ෂ 5 කට වඩා වැඩි රු.'000 |
|---|---|---|---|---|---|---|
| මුළු වත්කම් | 696,887 | 3,424,244 | 9,880,192 | 12,119,796 | 4,245,398 | 1,259,025 |
| මුළු ස්කන්ධය හා වගකීම් | 2,305,268 | 10,505,738 | 8,871,677 | 5,594,070 | 1,048,331 | 3,608,644 |
| පරිනත විවර විශ්ලේෂණය | (1,608,381) | (7,081,494) | 1,008,515 | 6,525,726 | 3,197,067 | (2,349,619) |

## 4. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

### 4.1 ණය හා අත්තිකාරම්
-------------------------

4.1.1 පසුගිය වර්ෂය හා සැසඳීමේදී ණය හා අත්තිකාරම් රු.මිලියන 3,405 කින් හෝ සියයට 13.77 කින් වර්ධනය වී තිබුණි. මෙම වැඩිවීම සඳහා ප්‍රධාන හේතුව සේවක ණය වීම හා මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීම් පහත පරිදි වේ. 2015 වර්ෂයේදී රු.මිලියන 2,376 ක සේවක ණය යෝජනා ක්‍රමය 2016 වර්ෂයේදී රු.මිලියන 4,681 දක්වා වැඩි වී තිබුණි. එය රු.මිලියන 2,305 කින් හෝ සියයට 97 කින් වැඩිවීමකි. මේ නිසා පුද්ගල ඇප මත ණය දීම මගින් ඉහළ අවදානමක් මෙම වර්ෂයේදී ලබාගෙන තිබීම හා ඉදිරි අයකර ගැනීම්වලදී හා සමාගමේ අරමුදල හසුරුවීමේ පිරිවැයට අහිතකර බලපෑම් ඇතිවිය හැකිය.

4.1.2 ණය හා අත්තිකාරම් සත්‍ය බදුදීම් හා කුලීපිට ගැනුම් අයවැයගත සංඛ්‍යාවට වඩා පිළිවෙලින් සියයට 19 කින් හා සියයට 25 කින් 2016 දෙසැම්බර් 31 දිනට වැඩි වී තිබුණි. බැංකුව බිල්පත් මගින් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුලෙස ඉලක්කගත මුදලට වඩා සියයට 46 ක් බැංකුව විසින් වියදම් කර තිබුණි. අයවැය විධිමත් කළමනාකරණ උපකරණයක් ලෙස බැංකුව විසින් භාවිතා කර නොතිබුණි.

4.1.3 සමාගමේ රන් ණය ක්‍රියාමාර්ගය අනුව වර්තමාන රන් ණය වටිනාකමින් සියයට 85 ක සීමාව ඇතුළත රන් ණය පහසුකම් ප්‍රදානය කළ යුතු වේ. නමුත් ගනුදෙනුකරුවන් විසින් එහි වෙළඳපල වටිනාකමින් සියයට 85 ක සීමාව ඉක්මවා ඉල්ලුම්කළ හොත් එය ණය කමිටුව විසින් අනුමත කළ යුතුය. කෙසේ නමුත් සමහර අවස්ථාවලදී රන් ණය කළමනාකරු විසින් වෙළඳපල වටිනාකමින් සියයට 85 සීමාව ඉක්මවා ණය ප්‍රදානය කර තිබුණු බව නිරීක්ෂණය විය.ණය කමිටුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව වෙළඳපල වටිනාකමින් සියයට 85 සීමාව ඉක්මවා අත්තිකාරම් ගනුදෙනුකරුවන්ට ලබාදීමෙන් සමාගමේ ණය අවදානම වැඩි විය හැකිය.

4.1.4 ක්‍රියාත්මක නොවන ණය හා අත්තිකාරම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) පසුගිය වර්ෂය හා සංසන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාත්මක නොවන ණය අනුපාතය සියයට 13.26 සිට සියයට 9.27 දක්වා අඩු වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) ක්‍රියාත්මක නොවන ණයවල හානිකරණ ආවරණය 2015 වර්ෂයේදී සියයට 6.06 ක් වූ අතර 2016 වර්ෂයේදී සියයට 3.82 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනය රු.මිලියන 445 කින් ලියාහැරීම ක්‍රියාත්මක නොවන අනුපාතය අඩුවීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

(iii) වෙළඳපලේ ක්‍රියාත්මක නොවන අනුපාතය වූ සියයට 5.3 සමඟ සංසන්දනය කිරීමේදී ඉහත සඳහන් ක්‍රියාත්මක නොවන අනුපාතය තවමත් ඉහළ අගයක් විය. සමාගමේ කොටසක වෙළඳපල මිල 2014 වර්ෂයේදී රු.17.50 සිට 2016 වර්ෂයේදී රු.13.60 දක්වා අඩුවීමට එය බලපා තිබුණි.

(ආ) රු.7,860,584 ක් වටිනා ක්‍රියාත්මක නොවන සේවක ණය 15 ක් 2016 දෙසැම්බර් 31 දිනට පැවති බව අනාවරණය විය. පූර්වෝක්ත මුදලින් රු.7,144,638 ක් හෝ සියයට 91 ක් 2007, 2013 හා 2014 වර්ෂවලදී මාණ්ඩලික නිලධාරීන් 04 දෙනෙකුට ප්‍රදානය කළ මුදලින් ලැබිය යුතු මුදල් නියෝජනය විය.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බිල්පත්වල වටිනාකම රු.මිලියන 874 ක් විය. රු.මිලියන 199.9 ක් හෙවත් සියයට 22.87 ක් මුළු හිඟ හිටි මුදලින් ක්‍රියාත්මක නොවන වර්ගයේ ඒවා විය.

4.1.5 1994 අප්‍රේල් 01 දින දේපලක් උකස් කිරීමට එරෙහිව රු.මිලියන 14 ක ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණේ ඉහත සඳහන් පහසුකම අයකර ගැනීමේ පරමාර්ථයෙනි. ඉහත ගනුදෙනුකරුට එරෙහිව නඩුවක් 1996 සැප්තැම්බර් 4 දින ගොනුකර තිබුණු අතර ප්‍රසිද්ධ වෙන්දේසියකදී එම දේපල විකිණිය යුතුබව දක්වමින් නඩු තීන්දුව දී තිබුණි.2005 ජූනි 16 දින පැවති වෙන්දේසියේදී ගැනුම්කරුවන් නොමැති වීම හේතුවෙන් දේපලේ නාමික වටිනාකම වූ රු.මිලියන 3 කට සමාගමට අත්කර ගැනීමට සිදුවී තිබුණි. කෙසේ නමුත් ඉහත සඳහන් කළ වත්කම වාහන සමූහයේ භාවිතයට ගෙන තිබුණු නමුත් සමාගමේ වත්කමක් සේ සලකා හෝ සමාගමේ දේපලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. තවද, ඉහත සඳහන් කළ දේපලේ වර්තමාන නීතිමය තත්ත්වය සැලකිල්ලට ගැනීමකින් තොරව 2016 වර්ෂය තුලදී (වර්ෂ 12 කට පසුව) ලියා හැර තිබුණි.

## 4.2 කළමනාකරණ අඩුපාඩු

-------------------------

ණය ප්‍රදානය කිරීමේදී ඇපවල වෙළඳපලභාවය, පිළිගත හැකි බව, ආරක්ෂාව හා පවරා දිය හැකි බව පිළිබඳව සමාගම විසින් ඇගයීමක් සිදුකර නොතිබුණි. නියැදියක් පරීක්ෂාවේදී බැංකුව එකතුව රු.මිලියන 33.25 ක ණය පෞද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණේ රු.මිලියන 28.11 ක් වටිනා ලොරි, ජීප් රථ හා කාර් වැනි වැහන 6 ක් ඇපයට තබා ගෙන වුණි.

(අ) මිල ප්‍රකාශිත කොටස් ආයෝජනයෙන් 2016 වර්ෂයේ රු.මිලියන 31.364 ක හා ආකාර්යක්ෂම ආයෝජන කළමනාකරණය හා කොටස් වෙළඳපල සම්බන්ධව කළමනාකරණය නොකිරීම හේතුවෙන් 2015 වර්ෂයේ රු.මිලියන 24.07 ක අලාභ සිදුවී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු වත්කම්වලින් දේපල හා උපකරණ සියයට 0.99 ක් ලෙස සටහන් වුනි. එය එකම දේපලක ශුද්ධ පොත් අගය වූ රු.මිලියන 11.3 කින් පමණක් සමන්විත විය. සියලුම ශාඛා බාහිර පාර්වයන්ගෙන් කුළියට ලබාගත් දේපලවල පවත්වා ගෙන ගොස් තිබුණි. එබැවින් සමාගම වර්ෂය තුලදී රු.මිලියන 60.130 ක කුලී වියදමක් සියලුම ශාඛා වෙනුවෙන් ගෙවා තිබීම හා කොල්ලුපිටියේ ඇති ප්‍රධාන කාර්යාලය පවා කුළියට ලබා ගත් ගොඩනැගිල්ලක පවත්වා තිබුණු අතර රු.මිලියන 62.573 ක පිරිවැයක් 2016 වර්ෂයේදී දරා තිබුණි.

(ඇ) සමාගම මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමේ සියයට 84.12 ක කොටස් ලබාගැනීමට රු.මිලියන 516 ක් ආයෝජනය කර තිබුණි. කෙසේ නමුත් පරිපාලිත සමාගම ඔවුන්ගේ මෙහෙයුම්වලින් නොකඩවා අලාභ ලබා තිබුණි. එමනිසා සමාගම එහි ආයෝජන කලින් කලට හානිකරණය කර තිබුණි. සමාගම සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 237.89 ක හානිකරණ ප්‍රතිපාදනයක් ඇති කර තිබුණු අතර රු.මිලියන 438.79 ක සමුච්චිත ප්‍රතිපාදනයක් හා රු.මිලියන 77.31 ක ආයෝජන ශේෂයක් 2016 දෙසැම්බර් 31 දිනට විය. කෙසේ නමුත් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පරිපාලිත සමාගමේ මුළු කොටස් අයිතිය ඉවත් කිරීමට තීරණයක් ගෙන තිබුණි. තවද, වාර්තා කිරීමේ දිනය වන විටත් මෙහෙයුම් කටයුතු නතර කිරීමට තීරණය කර නොතිබුණි.

(ඈ) සමාගමේ ජාල පද්ධතිය දිවයින පුරා ශාඛා 49 කින් සමන්විත විය. කෙසේ වුවත් සමාලෝචිත වර්ෂය තුලදී කිසිම නව ශාඛාවක් විවෘත කිරීමට නොහැකි වී තිබුණි. ඉහත ශාඛාවලින් ශාඛා 21 ක් හෙවත් සියයට 41 ක්ම බස්නාහිර පළාත තුල පිහිටුවා තිබුණි.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

(අ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.2 වගන්තිය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුවේ. එසේ වුවත්, සමාගම ඉහත අවශ්‍යතාවයට එකඟ වී නොතිබීම හා ශ්‍රේණි අනුව අනුමත කාර්ය මණ්ඩලය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2016 හා 2015 පසුගිය මුදල් වර්ෂ දෙක තුල සමාගමේ මුළු වියදමෙන් සියයට 50 කට වැඩි ප්‍රතිශතයක් නියෝජනය කළ සමාගමේ කාර්ය මණ්ඩල පිරිවැය පිළිවෙලින් සියයට 52 ක් හා සියයට 51 ක් නියෝජනය කෙරුණි.

## 4.4 සමාගමේ ගනුදෙනුකරු තැන්පත්

සමාගමේ ගනුදෙනුකරු තැන්පත් පහත සඳහන් අයිතමවලින් සමන්විත විය.

| | 2016 දෙසැම්බර් 31 දිනට | 2015 දෙසැම්බර් 31 දිනට | වෙනස | සියයට |
|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | |
| ස්ථාවර තැන්පත් | 17,790,162 | 15,153,099 | 2,637,063 | 17.40 |
| ඉතිරි කිරීමේ තැන්පත් | 728,257 | 693,207 | 35,050 | 5.06 |
| එකතුව | 18,518,419 | 15,846,306 | 2,672,113 | 16.86 |

(අ) පසුගිය වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී ගනුදෙනුකරු තැන්පත් රු.මිලියන 2,672 කින් හෝ සියයට 16.86 කින් වැඩි වී තිබුණි. කෙසේ නමුත් මුළු තැන්පත්වලින් සියයට 96 ක් සමාගමේ ස්ථාවර තැන්පත්වලින් 2016 දෙසැම්බර් 31 දිනට සමන්විත විය.

(ආ) මුළු තැන්පත්වලින් සියයට 84.29 ක් එනම් රු.මිලියන 15,608 ක් වර්ෂයක කාලයක් ඇතුලත කල් පිරුණු ඒවා බව නිරීක්ෂණය විය. කෙසේ නමුත් රු.මිලියන 14,001 ක මුළු මූල්‍ය වත්කම් වර්ෂයක් ඇතුලත කල් පිරෙන ඒවා විය. එම නිසා වර්ෂය අවසානයට ගනුදෙනුකරු තැන්පත් සංසන්දනය කිරීමේදී රු.මිලියන 1,607 ක කාලපූර්ණයෙහි නොගැලපීමක් තිබුණි.

(ඇ) තවද, ප්‍රධාන ස්ථාවර තැන්පත්කරුවන් 10 දෙනෙකුගේ රු.මිලියන 4,883 ක් සමාගමේ මුළු තැන්පත්වලින් සියයට 26.35 ක් නියෝජනය විය. ගනුදෙනුකරුවන් කීපදෙනෙකුගේ තැන්පත් මත රඳා පැවතීම මගින් සමාගමට දැඩි අවදානමක් පැවතීම හා මෙම ස්ථාවර තැන්පත් ලබා ගැනීම මගින් ඔවුන් සමාගමේ නතු කර ගැනීමට හා ඔවුන් රඳවා ගැනීමට ඉහළ පොලී ප්‍රතිශතයක් දැරීමට සිදු වී තිබුණි.

**4.5 සමාගමේ ශුද්ධ පොලී ආදායම**

-----------------------------------

පසුගිය වර්ෂය හා සන්සන්දනය කිරීමේදී 2016 දෙසැම්බර් 31 දිනට ණය හා අත්තිකාරම් රු.මිලියන 3,405 කින් හෝ සියයට 13.77 කින් හා පොලී ආදායම රු.මිලියන 665 කින් හෝ සියයට 16.32 කින් වැඩි වී තිබුණි. එම නිසා සමාගමේ ශුද්ධ පොලී ආදායම රු.මිලියන 89 කින් හෝ සියයට 4.59 කින් පමණක් වැඩි වී තිබුණි.

**5. සමාගමේ වෙළඳපල කොටස**

----------------------------------

**5.1 තැන්පත්, ණය හා අත්තිකාරම්වල වෙළඳපල කොටස**

-----------------------------------------------------------

2016 වර්ෂයේදී සමාගමේ මුළු තැන්පත්, ණය හා අත්තිකාරම්වල සමාගමේ වෙළඳපල කොටස පිළිවෙලින් සියයට 3.49 ක් හා සියයට 3.22 ක් වූ අතර 2015 වර්ෂයේදී ඒවා සියයට 3.29 ක් හා සියයට 3.42 ක් විය.

**5.2 සමාගම Fitch අනුව ශ්‍රේණිගත කිරීම**

------------------------------------------

"Fitch" දේශීය ශ්‍රේණිගත කිරීමෙහි සමාගම A ශ්‍රේණියෙහි (ICRA Lanka Limited) 2016 දෙසැම්බර් 31 දිනට විය.

**6. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විගණනය කරන අතරතුර මගේ විස්තරාත්මක වාර්තාවක් මගින් බැංකුවේ සභාපතිගේ අවධානය යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍ය කෙරේ.

| | | |
|---|---|---|
| (අ) ණය කළමනාකරණය | - | ප්‍රගතියක් පෙන්වන අනුපාත ක්‍රියාවට නොගැනීම. |
| | - | ඉහළම ප්‍රගතියක් නොපෙන්වන ගනුදෙනුකරුවන් හා ශාඛා. |
| | - | ණය ලියා හැරීම්. |
| (ආ) මානව සම්පත් කළමනාකරණය | - | සේවක වියදම්. |
| | - | කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය. |